# අලුත් සහල් මංගල්‍යය හෙවත් දෙවියන් වැඩීම හා බැඳුණු අභිචාර විධීන්

## (ආණමඩුව, කොට්ටුකච්චිය පුරාණ ගම්මානය ඇසුරිනි)

ජේ.එච්.එම්.එන්.එම්. ප්‍රේමරත්න

තෙ වැනි වසර, උරුම කළමනාකරණ හා පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (සාමාන්‍ය )

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*madupremarathna94@gmail.com*

### හැඳින්වීම

වයඹ පළාතේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හා කොට්ටුකච්චිය ග්‍රාම නිලධාරි කොට්ටාසයට අයත් ව මෙම ගම්මානය පිහිටා ඇත. පුත්තලම කුරුණෑගල ප්‍රධාන මාර්ගය ඔස්සේ මැල්ලන්කුලම මංසන්ධිය හරහා මෙම ගම්මානයට ප්‍රවේශ විය හැකිය. දැනට පවුල් 600ක් පමණ මෙහි වාසය කරයි. වසරේ වැඩි කාලයක් වියළි කාලගුණයක් පවතින අතර ප්‍රධාන ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙයි. ප්‍රධාන වශයෙන් අප්‍රේල් - ජුනි දක්වා ද සැප්තැම්බර් - දෙසැම්බර් දක්වා ද වර්ෂාව ලැබේ. වර්ෂාව පදනම් කරගෙන යල හා මහ කන්න වශයෙන් ඔවුන් වී වගාව මෙන්ම හේන් වගාවල ද නිරත වේ.

සිය ජීවිතයේ සෑම කටයුත්තකදී ම ආගමික අංශයට මුල් තැනක් ලබා දී ඇත. හේන හා ගොවිතැනින් නෙළා ගත් අග්‍ර ඵලය බුදුන්ටත්, දෙවනුව දෙවියන්ටත් වෙන් කිරීමට මොවුන් අමතක නොකරයි. සෑම නිවසක ම දෙවියන් හා බුදුන් වෙනුවෙන් වෙන් කරන ලද පහන් පැලකි. සුබ කටයුත්තක් ඇරඹීමට පෙර මෙන් ම තමන්ට හෝ පවුලේ අයට පැමිණෙන කරදරයක දී පොල් ගෙඩියක් හෝ පඬුරක් වෙන් කිරීම සිරිතකි. අයියනායක දෙවියන් හා ගම්බාර දෙවියන් උදෙසා මොවුන් තුළ විශාල භක්තියක් පවතින අතර ඒ හා බැඳුණු පූජා විධීන් ඉටු කිරීමට ගමේ සියලු දෙනා එකාවන් ව ක්‍රියා කරයි.

කච්චිමඩුව ගම්මානය අයත් වන්නේ වන්නි හත්පත්තුවට ය. මෙහි ප්‍රධාන වශයෙන් වන්නියට අධිපති අයියනායක දෙවියන් උදෙසා පුදසත්කාර සිදු කරයි. දැඳුරු ඔයෙන් මෙහා සිට පුත්තලම තබ්බෝව දක්වා අයියනායක දෙවියන් සිය අණසක පතුරවන බව වන්නිකරයේ ගැමියන්ගේ විශ්වාසයයි. අයියනායක දෙවියන් ගොඩබැස්සා යැයි සැළකෙන වේලාසිය පිහිටා ඇත්තේ ද මෙම ගම්මානය ආසන්නව ය. ඒ අනුව අයියනායක දේව ඇදහිල්ල මෙමෙ ප්‍රදේශය පුරා පැතිරී ඇති අතර ඒ උදෙසා බාරහාර වීම, කොළ අතු එල්ලීම, කිරි ඉතිරිවීම ආදිය ගැමියන් විසින් මහත් ගෞරවයෙන් ඉටු කරයි.

අයියනායක දෙවියන් හැරුණු විට ගම භාර ගම්බාර දෙවියන් උදෙසා ද සිය අස්වැන්නෙන් ලබන අග්‍ර කොටස වෙන් කරයි.

දෙවියන් වැඳීම හෙවත් අලුත් සහල් මංගල්‍යය නමින් හඳුන්වනු ලබන මෙම යාතු කර්මය ගම් පියසක් තුළ සෑම වසරක් තුළ ම අස්වැන්න නෙළීමෙන් පසුව සිදු කරයි. අලුත් සහල් යොදා ගෙන කරනු ලබන බැවින් ඒ සඳහා මෙම නම ලැබෙන්නට ඇත. දින වකවානු හා චාරිත්‍ර විධි ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. කච්චමඩුවේ ගැමියන් මෙම චාරිත්‍රය සිදු කරනු ලබන්නේ සෑම වසරක ම අලුත් අවුරුද්දට පෙර දිනයේදී ය. කුඹුරු අස්වද්දා නිවසට කරදරයකින් තොරව නිවසට ගෙන ඒම දක්වා වූ සියලු සාර්ථක කර දෙන ලෙස ගමේ සංහිඳේ දී සිදුකරන ලද බාරයක් ඔප්පු කිරීමක් ලෙස අස්වැන්න නෙළා ගැනීමෙන් පසු මේ ආකාරයට දෙවියන් වැඳීම සිදු කරනු ලබයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයට අදාළ මූලික දත්ත ලබා ගැනිමේ දී අභිචාර හා සිරිත් විරිත් සම්බන්ධයෙන් ලියවුණු ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සිදුකරන ලදී. එහි දී යොදාගත් මූලික ක්‍රමවේදය වූයේ සම්මුඛ සාකච්ඡාවයි. අභිචාර වූ කලී අරුතින් ම ජනතාවගේ හැසිරීම් හා චාරිත්‍රවාරිත්‍ර තුළින් ගොඩනැගුණකි. ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී තොරතුරු ලබා ගැනීම සඳහා සුදුසු ම මූලාශ්‍රය වන්නේ ඔවුන්ගේ ගැමි ජීවන අත්දැකීම් ය. මෙහි දී ගම්වාසී කපු මහතා, පන්සලේ හාමුදුරුවන්, ගමේ පිළිගත් පුද්ගලයින් සමඟ සාකච්ඡා කරමින් අදාළ දත්ත සපයා ගන්නා ලදී.

## අභිචාර විධි

- **දිනයක් හා වේලාවක් වෙන් කරවා ගැනීම**

ගමේ සියලු දෙනා පොදු ස්ථානයකට රැස්ව මේ පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. එය ගම් ප්‍රධානීයා හෝ ගමේ සමිති සමාගම්වල නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සිදු කරයි. මේ සඳහා සියලු දෙනාට පහසු කෙම්මුර දිනයක් (සෙනසුරාදා හෝ බදාදා) තෝරා ගනී. අදාළ දිනට පෙර සංහිඳ හෝ දේවාලය හුණු පිරියම් කර, සැරසිලි කර අවට ශුද්ධ පවිත්‍ර කර ගනී. මෙලෙස දිනයක් වේලාවක් වෙන් කර සියලු දෙනාට දැනුම් දීමෙන් පසු ගම තුළ පිටි කෙටීම, බැදුම් වර්ග සැකසීම කැවිලි වර්ග හා කිරිබත් පිසීම සිදු නොකරයි. මේ ආකාරයට අදාළ දිනය උදාවන තෙක් පේ වීම සිදු කරයි.

- **මූර්තං කද වැඩවීම**

දෙවියන් වැදීමේ ආරම්භක අවස්ථාව ලෙස මූර්තං කද වැඩමවීම සිදු කරනු ලබයි. (කිරි ඉතුරුමට අවශ්‍ය පොල්, හාල් ආදි ද්‍රව්‍ය ලණුවක් ආධාරයෙන් නාඹර පොල් පිත්තක එල්ලීම මූර්තං කද යනු එයයි.) එය සකස් කර ගනු ලබන්නේ නාඹර පොල් පිත්තක් ආධාරයෙනි. මෙහිදී පොල් පිත්තට අදාළ බර දැරීමට හැකි වන අයුරින් සකස් කර ගනු ලබයි. එහිදී අත්තෙහි ඉදිරිපස කොටස පොල් ගෙඩියක් ද පිටුපස කොටසහි පන් මල්ලක හාල් ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය තැන්පත් කරයි. එය කහ දියර ඉස, සුවඳ දුම් අල්ලා

ගනී. මේ ආකාරයට අවසානයේ එය සුදු පිරුවටයකින් ආවරණය කරගනී. එය ප්‍රධාන කපු මහතාගේ නිවසේ සකස් කර ගනු ලබන අතර මුර්තන් කද සකස් කර හේවිසි හා බෙරකරුවන් පැමිණෙන තුරු නිවස ඉදිරියේ කුඩා මේසයක් මත තැන්පත් කර එහි පහන් දල්වනු ලබයි.

මේ ආකාරයට සකස් කර ඉතා ගෞරව පූර්වකව උඩු වියන් මතින් හේවිසි වයමින් වැඩම කරයි. එහිදී මඟ දෙපස සියලු දෙනාම එයට සම්බන්ධ වේ. ඒ තුළින් සියලු දෙනාට දේව ආශිර්වාදය සැලසෙන බව ගැමියන්ගේ විශ්වාසයයි. එදින මුර්තං කද වැඩමවීමත් සමඟ සියලු දෙනාගේ ඒකරාශි වීමෙන් දෙවියන් වැදීමේ වැඩ කටයුතු ආරම්භ වේ.

- **කිරි ඉතිරවීම**

මුර්තං කද වැඩම වීමෙන් පසු කිරි ඉතිරවීමට අවශ්‍යය බඩු බාහිරාදිය සංහිඳ හෝ දේවාලය මත පැදුරක් එලා ඒ මත තැන්පත් කරයි. කිසි විටකත් එම භාණ්ඩ බිම තැන්පත් කරන්නේ නැත. කිරි ඉතිරිවීමට පෙර කහ දියර හා සුවඳ දුම් අල්ලනු ලබයි. පසුව දේවාලයේ ඇති මණ්ඩපය හෝ යහන (වියාගත් ගොක් කොළවලින් සකසන ලද පහන් වැට) මත පහන් හඳුන් කුරු පත්තු කිරීමෙන් පසු කිරි ඉතිරිමේ වැඩ කටයුතු අරඹයි.

එහිදී ප්‍රථමයෙන් මුර්තං කදේ තැන්පත් කර ඇති පොල් ගෙඩිය ද (උයන් වළු), පොල් මල ද, බුලත්, පුවක්, කපුරු, මාරු කාසි, ආදිය ද කහ දියර ඉස කොටස් තුනකට යහන (මල් පැල) මත තැන්පත් කරයි. මේ ආකාරයට කිරි ඉතිරුමට පෙර ද සෝදන ලද කැකුළු සහල් හා බිදගත් පොල් ආදිය ද යහන මත තබා (පේ කර) සුවඳදුම් අල්ලයි. අවසානයේ කපු මහතා සුළු කාලයක් දෙවියන් යදිති. එහි දී යහන මත පේ කරන (තබන ලද) පොල් ගෙඩිය ගා ගනු ලබන අතර, පොල් කිරි මුට්ටි තුනකට අවශ්‍ය පරිදි සකස් කර ගත යුතු ය. පළමුව කිරි ඉතිරීමට යොදා ගනු ලබන මුට්ටිය හුණු, ගොක්කොළ, බුලත් කොළ ආදිය යොදා සැරසිලි කිරීම සිදු කිරීම සිරිත ය. කිරි ඉතිරීම සඳහා නැවුම් මුට්ටියක් තෝරා ගනු ලබයි. එහි දී මුට්ටිය වටා හුණු යොදා ගෙන ත්‍රිශූල සළකුණ අඳිනු ලබයි. පසුව පොල් කිනිති තුනක් ගෙන එය උඩු අතට සිටින සේ කිනිත්ත බුලත් කොළයකට මැදිකර ඔතා ගනී. පසුව එම පොල් කිනිති තුන තුන් පැත්තට සිටින සේ මුට්ටිය වටා කෙළින් අතට සිටින සේ නවා ගොක්කොළවලින් බඳිනු ලබයි. කිරි ඉතිරවීමේ දී පළමු ව පොල් කිරි සහිත මුට්ටිය ලිප තැබීම සිදු කරයි. එහිදී ද නමස්කාර කිරීම හා දුම්මල ඇල්ලීම කරනු ලබයි. කිරි පැසීමෙන් පසු එයට හාල් එක්කරන අතර කිරි මුට්ටිය ඉදෙන තුරු හේවිසි වාදනය කරනු ලබයි. අවසානයේ දී හොඳින් ඉදුණු පසු සිනි හා ලුණු එකතු කරනු ලබයි.

- **පිදවිලි පිදීම**

මේ කිරි උතුරවා ලිපෙන් බා ගත් පසුව නැවත වරක් යහන මත පේ කරනු ලබයි. එහි දී කෙහෙල් කොළ නවා කහ දියර ඉස යහන මත තැන්පත් කරයි. අනතුරු ව කෙසෙල් කොලයක් නවා එය ගොටුවක් ආකාරයට සකස් කර ගනු ලබයි. පේ කිරීමේ දී යහන මත කොටෙස් තුනක් වශයෙන් ද යහනට

පහළින් තවත් කොටසක් වශයෙන් ද තැන්පත් කරනු ලබයි. එම කිරිබත් කොටස් පේ කිරිමේ දී අනිවාර්යෙන් ම කෙසෙල් ගෙඩියක්, කැවුමක් ද එක් කරයි. මේ ආකාරයට යහන මත පේ කරන සෑම අවස්ථාවක දී ම නමස්කාර කරමින් සුවඳදුම් ඇල්ලීමට අමතක නොකරයි. යහන මත පේ කරන ලද කිරිබත් මැද තටුව අයියනායක දෙවිඳුන්ට ද, දෙපැත්තේ කිරිබත් කොටස් දෙක ගම්බාර දෙවිඳුට ද, පහළ කොටස පණික්කි බණ්ඩාර දෙවිඳු හා සෙසු දෙවිවරුන්ට වෙන් කරයි. මල් පැළ අසළ සිටුවන කණුව මත තබන ලද ගොටුවලින් පුදනු ලබන්නේ කඩවර දෙවියන්ට ය.

ගොටුව සකස් කර ගැනීමේ දී අඩි තුනක් හෝ දෙකක් උසට ශක්තිමත් කණුවක් සකස් කර ගනී. එහි මුහුණත පතුරු වශයෙන් කොටස් හතරකට බෙදා ගනු ලබයි. කෙසෙල් කොළයෙන් සකස් කර ගනු ලබන ගොටුව තැන්පත් කරන්නේ ඒ පතුරු මතය. එය හඳුන්වන්නේ ඇවරි කණු නමින් ය. ඒ ගොටු දෙකට කිරිබත් මෙන්ම පුළුස්සන ලද කරවල කැබැල්ලක් ද තැන්පත් කරනු ලබයි. නමිනි. ඒ ගොටුව තැන්පත් කිරිමෙන් පසුව කුරුම්බා ගෙඩියක් කපා එහි ජලය තෙවරක් නමස්කාර කරමින් වත් කරනු ලබයි. පසුව කිරිබත් නැතහොත් දෙවියන්ගේ දානය සියලු දෙනා සංහිඳ අසළ පැදුරු දමා වාඩිවී එළා ගත් කෙසෙල් කොළය මතට කිරිබත් දමා සියලු දෙනා 'ආහාරයට ගැනීමෙන් මෙම චාරිත්‍රය අවසන් වේ.

**සමාලෝචනය**

අප සංස්කෘතිය වූ කලී සිරිත්විරිත් සම්ප්‍රදායන් යාතු කර්ම ආදියෙන් රසවත් වූවකි. එය රසවත් වීමට තවත් එක් හේතුවක් වන්නේ එහි ප්‍රදේශයෙන් ප්‍රදේශයට ආවේණික වූ සුවිශේෂී ලක්ෂණ පැවතීම ය. අපට උරුම සංස්කෘතික උරුමය වූ කලී වෙනත් කිසිදු ජාතියකට හිමි නොවන්නක් වීම අප සියලුදෙනාම ආඩම්බරයට පත් වීමට හේතු වන්නකි.

සිල්ප සතර දත් පමණින් සියලුදෙනා උගතුන් නොවන්නා සේම ගම්බඳ ව වාසය කිරිමෙන් ගැමියන් නුගතුන් වන්නේ ද නැත. ඔවුන් සතු ඥාණය, තාක්ෂණය, අභිචාර විධීන් සුවිශාල ය. වත්මන් විද්‍යාවේ පරික්ෂණ ඔස්සේ දෙවියන්ට පූජා පැවැත්වීම බාර හාර වීම ඵල රහිත ක්‍රියාවක් බව සනාථ වී හමාර ය. එහෙත් අප එයට ගැරහිය යුතු නැත. එවන් වූ අභිචාරයන් තුළින් සියලුදෙනා තුළ එකමුතුකම, සමගිය, සහයෝගය වර්ධනය වූ අතර අනන්‍යයන්ගේ අදහසවලට ගරු කරමින් එක්ව ක්‍රියා කිරීමට එය හොඳ අවස්ථාවක් විය. අනික් අතින් ඔවුන් ගොවිතැන් ආදියේ දී අව්ව වැස්ස ආදියට දේවත්වයක් ආරෝපණය කළේ ය. ඒ තුළින් පරිසරය සුරකින සතා සිව්පාවුන්ට ආදරය කරන පරිසර හිතකාමින් මිනිසුන් පිරිසක් බිහි විය. ඒ තුළින් දේව ආශිර්වාදය නොලැබුණ ද සොබා දහමේ ආශිර්වාදය ඔවුන්ට හිමි විය. මිනිසා නැණ නුවණින් සාරවත් වුව ද අහිමිවුයේ අපේ මිනිසත්කම නොවේද? අප සංස්කෘතිය නොවේද? මෙය අප අතරින් වියැකී යන උරුමයන් මියැදෙන්නට පෙර එක්

වරක් හෝ ප්‍රාණය ලබා දීමට ගත් සුළු වෑයමකි.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


උඩවත්ත පියදාස, ***වැව් ගම්පත්තුවේ විත්ති,*** පී.ද ඇස් කුලරත්න මාවත, කොළඹ 10.

දළුපත මහින්ද කුමාර, ***වැව හා සංස්කෘතිය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.


**සම්මුඛ සාකච්ඡා**

**කිරි බණ්ඩා, ඒ. එච්. එම්** (කපු මහතා), කච්චිමඩුව,කොට්ටුකච්චිය 30.11.2017 ප.ව 4.00 සිට 6.00 දක්වා

**හේරත් බණ්ඩා, ඒ. එච්. එම්.** (ගැම පිළිබඳ දන්නා උගත් වැඩිහිටියෙකි) කච්චිමඩුව, කොට්ටුකච්චිය 01.12.2017 පෙ.ව 8.00 සිට 10.30 දක්වා